**අම්පාර නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජුලි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 අගෝස්තු 15 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, මෝටර් රථ හා කරත්ත වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 වර්ෂයේ සභා අරමුදල් යටතේ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 03 කට අදාල නිමි වැඩ වටිනාකම රු.1,393,346 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.997,101 ක වියදමක් දරා ඉදිකර තිබුණු සභාව සතු කොම්පෝස්ට් අංගනය සහ වාහන අංගනය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඉටුකරන ලද කර්මාන්ත 04 ක් සඳහා ගෙවිය යුතු රු.1,476,181 ක් සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | පිළිගතිමි. ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (v) 2018 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ නවගන්ගොඩ 7 වන පටුමඟ අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය සඳහා ගෙවිය යුතු 748,926 ක් සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු වැටුප් හා මන්ත්‍රී දීමනා රු.5,262,740 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට උපචිත වර්ෂය පදනම් කර ගනිමි. |
| (vii) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් ආයතන 02 කින් ලැබිය යුතු රු.320,000 ක ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට උපචිත වර්ෂය පදනම් කර ගනිමි. |
| (viii) පරිග්‍රහණ ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් හා පරිත්‍යාග පොත් වල වටිනාකම රු.308,995 ක් රු.230,115 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට උපචිත වර්ෂය පදනම් කර ගනිමි. |
| (ix) සමාලෝචිත වර්ෂයට අදාල රු.455,866 ක් වූ මිළදී ගැනීම් සඳහා මූල්‍ය ප්‍රකාශන වල පොදු සැපයුම් ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට උපචිත වර්ෂය පදනම් කර ගනිමි. |
| (x) සභාව සතු ස්ථාවර තැන්පතු 02 කට අදාල සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.263,009 ක පොලිය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට උපචිත වර්ෂය පදනම් කර ගනිමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

-------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------- | ---------- | ------------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් විෂයන් 05 ක ශේෂයන් ඒවාට අදාල උපයෝගී පොත්පත් හා ලේඛනවල ශේෂයන් අතර රු.2,203,955 ක වෙනස්කම් පැවතුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි.<br>ලේඛන සමඟ සසඳා බලා ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එකතු කරන ලද රු.3,106,385 ක එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු..158,600,241 ක වත්කම් විෂයන් 04 ක් හා රු.14,859,005 ක වගකීම් විෂයන් 03 ක් අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූලා‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | ඉදිරි වර්ෂයේදී අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික සකස් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත | සේවකයින් 22 දෙනකු වෙනුවෙන් 2018 වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් රු.375,147 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී සේවක අර්ථසාධක අරමුදල් ප්‍රේෂණය කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1980 අංක 46 දරන සේවා නියක්තිකයන්ගේ භාර අරමුදල් පනත | සේවකයින් 22 දෙනකු වෙනුවෙන් 2018 වර්ෂයේ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් රු.93,864 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ප්‍රේෂණය කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | i. මුදල් රෙගුලාසි 396(ඇ) | ගිණුම් දෙකකට අදාලව ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබූ රු.51,468 ක් වටිනා චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. දැනට මේ සම්බන්ධව කටයුතු කරගෙන යනු ඇත. |
| | ii. මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.4,351,367 ක් වූ වර්ෂ 02 ඉක්ම වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. දැනට වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරගෙන යනු ඇත. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | අංක 30/2016 දරන 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 24 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. දැනට මේ සම්බන්ධව කටයුතු කරගෙන යනු ඇත. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | දැනට පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කරමින් පවතී. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2006 රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 වගන්තියට අනුකූල නොවී වැට් බදු ඉන්වොයිස් පත්‍රයක් ලබා නොගෙන 2018 වර්ෂයේ ඉටුකරන ලද කර්මාන්ත 03 ක් සඳහා එකතුකල අගය මත බදු රු.206,251 ක් ගෙවා තිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී බදු ඉන්වොයිස් පත්‍ර ලබා ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ආ) ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ප්‍රකාරව වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 දින හෝ ඊට පෙර ගෙවීම පිළිබඳ විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත දැනුම් දී නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත දැනුම් දීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,582,732 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,744,657 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු ශේෂය රු.5,649,109 ක් වූ බැංකු ගිණුම් 02 ක් වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. මහජන බැංකුවේ ගිණුමේ බැංකු සැසැඳුම් සකස් කිරීමට කටයුතු යොදා ඇත. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් හා බදු | 8,831,000 | 8,903,372 | 8,377,577 | 26,307,590 | 10,720,000 | 11,188,507 | 9,955,907 | 25,781,795 |
| කුලී | 18,019,880 | 11,441,405 | 11,443,976 | - | 7,723,650 | 6,212,365 | 7,156,619 | 2,571 |
| බලපත්‍ර ගාස්තු | 1,404,000 | 3,227,021 | 3,227,021 | - | 866,000 | 1,939,152 | 1,939,152 | - |
| වෙනත් ආදායම් | 29,295,475 | 35,991,983 | 35,619,662 | 1,413,000 | 28,903,475 | 26,931,731 | 26,003,175 | 1,984,431 |

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී අයකළ යුතු මුළු ආදායම රු.87,332,578 ක් වූ අතර, වර්ෂය තුළ රු.58,668,236 ක් හෙවත් 67% ක් රැස්කර ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී සකස් කර ගැනීමට කටයුතු කරමි |

### 2.3.3 උසාවි දඩ

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.567,500 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ අයකර ගත යුතු වේ. | පිළිගනිමි. දැනට ඒ සම්බන්ධව කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු බැවින් වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී නොතිබුණි. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මකට ඇතුලත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 03 කට අදාලව සමාලෝචිත වර්ෂයේ සෑම මසකම අවසානයේ දී මුදල් ශේෂය රු.6,246,996 සිට රු.33,927,458 දක්වා පරාසයක පැවති අතර එම මුදල් ඵලදායි ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්ත මුදල් ආයෝජනය කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාවේ ගණකාධිකාරී තනතුර 2010 සිට පුරප්පාඩු වී තිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 26 ක් සඳහා නිලධාරීන් 61 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් කැබලි 42 ක සහ වාහන 14 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපල සහ වාහන වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 වසරේ රු.327,297 ක් වැයකර සභා කාර්යාලයේ උඩුමහල් වැසිකිළිය ඉදිකිරීමට | නොකළ වැඩ වෙනුවෙන් කල | අදහස් දක්වා නොමැත |

| | | |
|---|---|---|
| අදාලව නොකළ වැඩ වෙනුවෙන් රු.60,314 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. | |

(ආ) නගර සභාවේ තානායම ඉදිකිරීමේ පළමු අදියර

| | | |
|---|---|---|
| i. 2017 සහා අරමුදල් යටතේ තානායම ඉදිකිරීමේ පළමු අදියර ගිවිසුම් ප්‍රකාරව 2018 මාර්තු 05 දින සිට මාස 06 ක් ඇතුලත නිමකළ යුතු වුවත්, විගණන දිනය වූ 2019 ජූලි 02 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවට අදාල කාර්යසාධන බැඳුම්කර හෝ වලංගු කාලය 2019 මාර්තු 04 වන දිනෙන් අවසන් වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කොන්ත්‍රාත් ඉදිකිරීම් කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත |
| ii. ප්‍රමාණ පත්‍රයේ 7 වන වැඩ විෂය ප්‍රකාරව රු.91,350 ක් වටිනා එල්ලෙන ලාම්පු සවිකිරීම වෙනුවට මිළ අඩු LED බල්බ සවිකර තිබුණි. | ඇස්තමේන්තුව පරිදි කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොමැත |
| iii. ප්‍රමාණ පත්‍රයේ 8 වන වැඩ විෂය ප්‍රකාරව ප්‍රධාන වයර් මීටර් 35 ක් සවිනොකර, ඒ වෙනුවෙන් රු.13,300 ක් ගෙවීම් කර තිබුණි. | නොකළ වැඩ වෙනුවෙන් කල ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජූලි 15 දින විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යවස්ථාපිත කාලය තුල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වේ. | අදහස් දක්වා නොමැත |